**ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

**----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම් අරමුදලින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත දී තිබූ ණය මුදල දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ආදායමෙන් 1/3 ක කොටසින් අර්ධයක් මගින් පියවා ගැනීමට ඉඩ දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ද ණය මුදල සඳහා අඩුකරගත් රු.127,849,052 ක මුදල, මාසික ගිණුම් සාරාංශ මගින් ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස දැක්වීම හේතුවෙන් සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු (20.03.02.01) ආදායම් ශීර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන විමසුම හා එකග වන අතර ඒ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව උපදෙස් ලබා ගෙන 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ වල ගැලපීමට කටයුතු කරන බව. | දේශීය ණය ආපසු ගෙවීම් වැය සම්මත සංකේතයක් අනුමත කර එමඟින් දී තිබූ ණය මුදල පියවීම කළ යුතු අතර ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස දැක්වීම නොකළ යුතුය. |

#### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර මුද්‍රිත අනුව අත්තිකාරම් ගෙවීම් රු.8,362,506 ක් වී තිබුණද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් ලෙස රු.8,358,506 ක් දැක්වීම නිසා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අත්තිකාරම් ගිණුම් ශේෂය රු.4,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාන මාරු වී පැමිණි නිලධාරිනියකගේ රු.4,000 ක විශේෂ අත්තිකාරම් ණය ශේෂය අත්තිකාරම් බී ගිණුමේ නිවැරදිව සටහන් වුවද, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ගැලපීමට නොහැකි වූ බැවින් අත්තිකාරම් ගෙවීම් අඩුවෙන් සටහන් වී ඇත. එය නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වෙනත් දෙපාර්තමේන්තු විසින් අත්තිකාරම් ගිණුමට සිදුකරන ලද හර කිරීම් හඳුනාගෙන ගැලපීම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2007 අංක 7 දරන සමාගම් පනතේ 131(1) සහ (2) වගන්ති ප්‍රකාරව ලියාපදිංචි සමාගම් වාර්ෂික වාර්තා භාර නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට හිඟ හිටි ආදායම රු.3,389,232,000 ක් වී තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 13 කින් වර්ධනයක් වී තිබුණි. මින් 1/3 කොටස වන රු.1,129,744,000 ක් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු විය. | මේ පිළිබඳ කරුණු සොයා බලා කඩිනමින් වාර්තා කිරීමට කටයුතු කරන බව. | වාර්ෂික වාර්තා ගොනු කිරීම උනන්දු කරවීම සහ වාර්ෂික වාර්තා ගොනු නොකළ සමාගම් වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකර හිඟ ආදායම අඩුකිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 1891 අංක 16 දරන සමිති ආඥා පනතේ (123 වන අධිකාරිය) 8(1)(ඇ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අවසානයට වාර්ෂික වාර්තා ගොනු කළ යුතු ක්‍රියාකාරී සමිති සංඛ්‍යාව 15,884 කින් සමිති 60 ක් වාර්ෂික වාර්තා ගොනු කර රු.60,000 ක ආදායමක් රැස්කර තිබුණි. එහෙත් එසේ නොකළ සමිතිවල ක්‍රියාකාරී තත්වය පරීක්ෂා කර ලැබිය යුතු ආදායම රැස් කිරීමට කටයුතු කර නොතිබුණි. | රජයේ ව්‍යාපෘති හෝ පෞද්ගලික අංශයේ ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන පසුතලය එම ප්‍රජාව තුළින්ම ක්‍රියාවට නැංවීම සඳහා සමිති ලියාපදිංචි කර ඇති බවත් එම ව්‍යාපෘති නතර වීමෙන් පසු හෝ ආරම්භයේ පටන්ම කිසිඳු ආකාරයකින් ක්‍රියාත්මක නොවීම මත මෙම සමිති අක්‍රීයභාවයට පත්වන බව. එබැවින් මෙම සමිති, සමිති ආඥා පනතේ දැක්වෙන ක්‍රමවේදය අනුගමනය කරමින් සමිති 242 ක නාමය කපා ඇති අතර අනෙක් සමිතිවල නාමය කපාහැරීමට කටයුතු කරමින් පවතින බව | සක්‍රීය සමිති නිවැරදිව හඳුනාගෙන, ලැබිය යුතු ආදායම රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛයේ 1.1.7 වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරුවන නිලධාරීන්ගේ ණය ශේෂ ස්ථාන මාරු වී මාස 03 ක් ගතවීමෙන් පසු නිරවුල් නොවූ ණය ශේෂ ලෙස නොපෙන්වීමට වගබලා ගත යුතු වුවත්, වෙනත් දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුට අදාළව රු.120,741 ක මුදලක් ස්ථාන මාරු වී වර්ෂ 22 ක සිට වර්ෂ 33 ක් අතර, කාල පරාසයක් ගතවී ඇතත්, නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් තිදෙනාම ස්ථානමාරු වී ගිය එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් විස්තර 2023 වර්ෂයේ මැයි මස දී ඉල්ලා ඇති අතර, තොරතුරු ලද පසු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි **I** කොටසෙහි 3.1 ඡේදයේ දැක්වෙන මු.රෙ. 113(6)(ආ) ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරෙහි අනුමත නිලධාරීන් 7 කගෙන් 2022 දෙසැම්බර් 31 දිනට තිදෙනෙකුගේ පුරප්පාඩු තිබීමත් එයින් එක් තනතුරක් වසර 3 ක කාලයක සිට පුරප්පාඩුව පැවතිණි. | තනතුරු නාමය සංශෝධනය වී ඇති බැවින් සංශෝධිත බඳවා ගැනීමේ පටිපාටිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු සීමිත ධාරාව යටතේ එක් නිලධාරියෙක් හා විවෘත පදනමින් එක් නිලධාරියෙක් බඳවා ගැනීමට කම්ටු එකඟත්වය දී ඇති බව. | සමාගම් ලියාපදිංචි කිරීමේ වර්ධනයක් පවතින පසුබිමක අධීක්ෂණය භාර විධායක නිලධාරීන්ගේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | තොරතුරු තාක්ෂණ අංශයට අනුමත නිලධාරීන් 11 න් අධ්‍යක්ෂ ද ඇතුළුව තනතුරු 8 ක් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවතුණි. **e – ROC** පරිගණක පද්ධතියේ ගිවිසුම පරිදි | මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් කටයුතු කරන අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති අතර රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා | දෙපාර්තමේන්තු කාර්යභාරය මාර්ගගතව **e – ROC** පරිගණක පද්ධතිය තුළින් සිදු වන බැවින් |

| | | | |
|---|---|---|---|
| | දෙවන නඩත්තු වසර වන විට පද්ධතිය පවත්වාගෙන යාමේ දැනුම සම්පූර්ණයෙන් හුවමාරුවී තිබිය යුතු වුවත් මෙම අංශයට අදාල පුරප්පාඩු පැවතීම හේතුවෙන් පද්ධතියේ ඉදිරි මෙහෙයුම් හා සංවර්ධන කටයුතු සඳහා මෙන්ම පද්ධතිය බිඳවැටීමකින් තොරව දෙපාර්තමේන්තු කටයුතු ප්‍රසස්ථ මට්ටමෙන් පවත්වාගෙන යැමට අහිතකර බලපෑමක් විය හැකි බැව් නිරීක්ෂණය විය. | පත් කරන ලද නිලධාරී කමිටුව වෙත ද ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | තොරතුරු තාක්ෂණ අංශයේ පුරප්පාඩු පුරවා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඇ) | ද්විතීයික මට්ටමේ තනතුරක් වන සමාගම් පරීක්ෂක තනතුර සඳහා අනුමත තනතුරු 10 න්, තනතුරු 05 ක් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවතුණි. එයින් තනතුරු දෙකක් සීමිත පදනම මත බඳවාගත යුතු තනතුරු විය. මෙම පුරප්පාඩු හේතුවෙන් 2007 අංක 7 දරන සමාගම් පනත උල්ලංඝනය කරන සමාගම් වලට එරෙහිව නඩු පැවරීම මන්දගාමීවීම මත ආදායම් අයකර ගැනීමේ ක්‍රියාවලියට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | සමාගම් පරීක්ෂක නිලධාරී තනතුර අත්‍යාවශ්‍ය බඳවා ගැනීමක් වන බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද නිලධාරී කමිටුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බව. | සමාගම් පරීක්ෂක තනතුරු සඳහා බඳවාගැනීම් කඩිනම් කළ යුතුය. |
| (ඈ) | සහකාර/ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන) තනතුර සහ වසරකට වැඩි කලක සිට පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතුණි. | සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන) තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | දෙපාර්තමේන්තු පරිපාලන කටයුතු සම්බන්ධව අතවශ්‍ය තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය. |